එම්බීඑස්එල් ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ් - 2017
-----------------------------------------------------------------

එම්බීඑස්එල් ඉන්ෂුරන්ස් කම්පැණි ලිමිටඩ්හි 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (‘මණ්ඩලය’) වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**මතය අවධාරණය කිරීම**

-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මාගේ මතය තත්ත්වාගණනය කිරීමෙන් තොරව අඛණ්ඩ පැවැත්ම යන උපකල්පනය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන 33 වෙන මාගේ අවධානය යොමු කරමි.

**2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

-----------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල බවත්ය.

- 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධිත) පනතෙහි 53 වගන්තිය ප්‍රකාරව දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ලෙස සමාගම් දෙකක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම විසින් වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.

- 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි 47 (2) වගන්තිය ප්‍රකාරව, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන පරිදි, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කර ඇති රීති මගින් දක්වා ඇති පරිදි, එහි දැක්වෙන ආකාරයට සමාගම විසින් ගිණුම් වාර්තා පවත්වා තිබුණි.

  කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල සටහන 33 හි හෙළදරව් කර ඇති පරිදි, ප්‍රාග්ධන ප්‍රමාණවත් බවෙහි අනුපාතය හා පවතින මුළු ප්‍රමාණය සඳහා සකසා ඇති, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි දැක්වෙන අවම අවශ්‍යතා, ජීවිත රක්ෂණ නොවන ව්‍යාපාර සම්පූර්ණ නොකරයි. "නුබුන්වත් අනුපාත රීති (අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය) 2015" වන අතර පවතින මුළු ප්‍රාග්ධනය සඳහා සකසා ඇති අවම අවශ්‍යතා ජීවිත රක්ෂණ ව්‍යාපාර සම්පූර්ණ නොකරයි.

**2.2 නීති, රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------------------

විගණනයේදී පහත අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2000 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 163 වගන්තිය සමඟ කියවිය යුතු 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ පනතෙහි 08 වන වගන්තිය. | රු.9,349,718 ක ජාතිය ගොඩනැගීමේ බද්ද මත ගොඩබෑමේ ආදායම් සමාගම විසින් ගෙවා නොතිබූ අතර හිඟහිටි බදු මුදල් හා දඩ මුදල් පිළිවෙලින් රු.93,498 ක් හා රු.46,749 ක් විය. |

| | |
|---|---|
| (ආ) 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධන) පනතෙහි 53 වන වගන්තිය. | ජීවිත රක්ෂණ නොවන ව්‍යාපාර වෙන් කළ යුතු අතර මෙම වෙන් කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාගමක් විසින් ජීවිත රක්ෂණ ව්‍යාපාරයක් සඳහා නව බලපත්‍රයක් ලබාගත යුතුය. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය වන විටත් සමාගම විසින් නව බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි 53 වගන්තිය හා 2014 පෙබරවාරි 06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1848/26. | ජීවිත රක්ෂණ ව්‍යාපාරය අවම ප්‍රාග්ධන අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.46,436,000 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු.220,524,000 ක් විය. ඒ අනුව බදු පෙර ශුද්ධ අලාභය රු.174,088,000 කින් අඩු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 සැලසුම් කිරීම**

සෑම මුදල් වර්ෂයක්ම ආරම්භයට පෙර ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික අයවැය ලේඛනය හා අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන තිබිය යුතුය. කෙසේ වෙතත්, 2016 ඔක්තෝබර් 04 දින ව්‍යාපාර බලපත්‍රය අත්හිටුවීමෙන් පසු, 2017 වසරට අදාළ ඉහත ලිපි ලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

**5.1 විගණන කමිටුව**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය යටතේ නිකුත් කර ඇති යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශය පිළිබඳ අත්පොතෙහි 7.4.1 වගන්තිය ප්‍රකාරව, අවම වශයෙන් මාස 03 කට වරක්වත් නිතිපතා විගණනය හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන හා කළමනාකරණ රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

**5.2 ආයෝජන කමිටුව**

**---------------------**

විධිමත් පරිදි පත් කරගත් ආයෝජන කමිටුවක් සමාගම සතුව නොතිබුණි. ප්‍රධාන මූල්‍ය නිලධාරියා හා ප්‍රධාන විධායක නිලධාරියා විසින් දිනපතා ආයෝජන තීරණවලට එළඹ තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව සියලුම වැදගත් ආයෝජන තීරණවලට එළඹීම සිදු කර තිබුණි.

**5 පද්ධති හා පාලනයන්**

**--------------------------**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය වූ දුර්වලතා |
| --- | --- |
| තොරතුරු තාක්ෂණ පාලනය | තොරතුරු තාක්ෂණ පාලනය පිළිබඳ විධිමත් පාලනයක් ක්‍රියාත්මක කර නොතිබීම හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ අභ්‍යන්තර විගණනය පවත්වා නොතිබීම. |